## ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - 2017

---------------------------------------------

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2018 ජූලි 31 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් සේවකයන්ට ණය ගෙවීම සඳහා ලැබුණු සහ ගෙවන ලද ණය රු.57,777,625 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කල්බදු වාරික වලට අදාළ පොළී ගෙවීම් රු. 1,579,262 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ඇ) විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද රු.14,673,898 ක්, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.18,660,750 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මුදල් ගලායාම රු. 3,986,852 කින් වැඩියෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී ආපසු ලබාගෙන තිබුණු එකතුව රු. 11,970,474 ක් වූ ස්ථාවර තැන්පතු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු. 11,062,216 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.908,258 ක් අඩුවෙන් දැක්වුණි.

(ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම ගණනය කිරීමේදී පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ රු. 262,500 ක් වූ ආරම්භක මුදල් ශේෂය ගලපා නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

උපචිත පදනම අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුණද කෘෂි විද්‍යා පීඨ ගොවිපලේ ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.126,054 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළව 2018 වර්ෂයේදී ලැබී තිබූ රු. 167,700 ක ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබීමෙන් ගොවිපළේ ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබූ බව නිරීක්ෂණය විය.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සේවා සඳහා ගෙවිය යුතු රු. 5,545,307 ක් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී මහපොළ ශිෂ්‍යත්ව සඳහා ලැබී තිබුණු රු. 2,513,700 ක් සමාලෝචිත වර්ෂයේ මහපොළ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට මහපොළ භාරකාර අරමුදලින් ලැබිය යුතු මහපොළ ශිෂ්‍යත්ව ආදායම රු.1,830,150 වුවත් ගිණුම්ගත කර තිබුණේ රු.1,168,250 ක් වූයෙන් ලැබිය යුතු මහපොළ ශිෂ්‍යත්ව ආදායම රු.661,900 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2018 වර්ෂයට අදාලව එම වර්ෂයේදී ශිෂ්‍යාධාර සඳහා ලැබී තිබුණු රු. 3,042,800 ක් සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍යාධාර ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසවල විශ්වවිද්‍යාලය විසින් පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ මෙහෙයුම් වියදම් සඳහා දරන ලද එකතුව රු.389,218 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට පෙර වර්ෂ වියදමක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයට අදාල ශිෂ්‍යාධාර ආදායම රු. 49,933,300 ක් දක්වා තිබුණද ශිෂ්‍යාධාර වියදම රු. 49,761,500 ක් ලෙස රු.171,800 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.4 නොසැසඳු පාලන ගිණුම්

විශ්වවිද්‍යාලයේ විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයට ගෙවිය යුතු ලෙස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල රු.27,916,036 ක් දක්වා තිබුණද විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ මූල්‍ය ප්‍රකාශනවල, සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාලයෙන් ලැබිය යුතු ලෙස රු. 25,311,637 ක් දක්වා තිබීමෙන් එම ශේෂයන් අතර රු. 2,604,399 ක වෙනසක් විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් | 57,295,890 | හිමිකම් සහතික / පැවරුම් නියෝග |
| ගොඩනැගිලි | 3,118,583,084 | (i) ස්ථාවර වත්කම් ලේඛන<br>(ii) සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ජල පිරිපහදු ඒකකය | 9,113,148 | |
| කාර්යාල සහ ඉගෙනුම් උපකරණ | 751,681,342 | |
| පරිගණක සහ උපාංග | 303,809,165 | |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 143,701,291 | |
| මෝටර් වාහන | 130,427,226 | |
| සන්නිවේදන උපකරණ | 34,415,008 | |
| උපාධි ලෝගු | 3,149,512 | |
| වෙනත් උපකරණ | 155,939,913 | |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂි විද්‍යා පීඨයට අයත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවකු වෙත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු. 1,179,621 ක් ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරු විසින් එම කාර්යය අත්හැර දමා ඇති බැවින් ගෙවන ලද අත්තිකාරම 2018 ජුනි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) වර්ෂ 01 සිට වර්ෂ 18 ක කාලපරිච්ඡේදයක සිට පැවත එන සේවකයින් 12 දෙනෙකුගේ ණය ශේෂ 21 කට අදාළව ලැබිය යුතු රු. 656,662 ක් 2018 මැයි වනවිටත් අයකර ගෙන නොතිබුණු අතර වර්ෂ 06 කට වැඩි කාලයක සිට පැවත එන රු. 105,525 ක් වූ විවිධ ණයගැති ශේෂ 04 ක් 2018 ජුනි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) අධ්‍යයන වර්ෂ 04 ක් වෙනුවෙන් මහපොළ භාරකාර අරමුදලෙන්, මහපොළ ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිපාදන ලැබෙන තෙක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දී තිබූ ශිෂ්‍යාධාර රු. 27,009,550 ක් මහපොළ භාරකාර අරමුදලෙන් පසුව විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබුණද, එම ශිෂ්‍යාධාර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත නිරවුල් කිරීමට 2018 මැයි වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉදිකිරීම් කොන්ත්‍රාත්වලට අදාළ අවසාන බිල්පත්වල කටයුතු අවසන් නොකිරීම මත කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු එකතුව රු. 69,617,688 ක ශේෂ 8 ක් නිරවුල් කිරීමකින් තොරව 2015 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 112 (1) වගන්තිය | 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා සමාජවිද්‍යා හා භාෂා අධ්‍යයන පීඨයේ ශිෂ්‍ය සභාවට ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික තනතුර සඳහා ආචාර්යවරයෙකු පත්නොවීම හේතුවෙන් 2018 මැයි වනවිටත් සභාව ක්‍රියාකාරී තත්ත්වයට පත්වී නොතිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| (i) | III වන පරිච්ඡේදයේ 18.12.1(I) වගන්තිය | සේවයෙන් පහ කරනු ලැබූ හෝ පරිවාස කාලයේදී විනයානුකූල හේතු මත සේවය අවසන් කරනු ලැබූ තැනැත්තන් කොමිෂන් සභාවට හෝ උසස් අධ්‍යාපන ආයතනවලට පත් නොකිරීම සහතික කර ගැනීමට හැකිවන පරිදි එවැනි තැනැත්තන්ගේ නාම සූචියක් පවත්වා ගෙන යා යුතු බව දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) | V වැනි පරිච්ඡේදයේ 7.6 වගන්තිය | 2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ නිළධාරීන් 14 දෙනෙකු ආපසු සේවයට වාර්තා නොකිරීම නිසා බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයකර ගත යුතු රු. 68,943,858 ක් 2018 මැයි වන විටත් අය කරගෙන නොතිබුණි. |
| (iii) | V වන පරිච්ඡේදයේ 7.8 වගන්තිය | සේවයෙන් පහ කරනු ලැබූ කථිකාචාර්යවරයෙකු නැවත රාජ්‍ය සංස්ථාවල හෝ සංස්ථාපිත මණ්ඩලවල රැකියා ලබා ගැනීම වැලැක්වීම සඳහා එවැනි කථිකාචාර්යවරයෙකු සේවය හැරගිය බව ප්‍රකාශ කෙරෙන දැන්වීමක් විශ්වවිද්‍යාලය විසින් නිකුත් කර ඒ බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර අංශයේ අධ්‍යක්ෂ වෙත දැන්වීමට කටයුතු කළ යුතුය. එලෙස කටයුතු නොකිරීම නිසා 2007 වර්ෂයේ සේවයෙන් පහකරනු ලැබූ කථිකාචාර්යවරයෙකු නැවත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස පත්වී තිබුණි. |
| (iv) | XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සනාථ කර ගැනීමකින් තොරව අධ්‍යයන කාර්යමණ්ඩලයේ 259 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු. 468,595,919 ක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පැවත එන එකතුව රු.19,791,816 ක් වූ ටෙන්ඩර් තැන්පතු, රැඳවුම් මුදල්, ලංසු සුරක්ෂණ සහ විවිධ තැන්පතු යන කල් ඉකුත් වූ තැන්පතු 129 ක් නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.1 හා 7.2 වගන්ති | විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 90,808,260 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 26,902,016 ක් වීමෙන් 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 117,710,276 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ගිවිසුම්ගත සේවා පිළිවෙලින් රු.79,786,033 කින් හා රු. 34,230,134 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.47,093,974 ක් වූ ඌනතාවය උච්ඡාවචනයන් සහිතව 2015 වර්ෂය වන විට රු.22,927,315 දක්වා අඩු වී තිබුණි. නමුත් 2016 වර්ෂයේ දී මූල්‍ය ප්‍රතිඵලය රු. 39,224,605 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී 2017 වර්ෂයේ දී එය රු. 90,808,260 ක ඌනතාවයක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු. 565,589,804 ක් වූ දායකත්වය 2017 වර්ෂය වන විට රු. 1,097,115,850 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2017 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් 0.38 හා 0.67 ක් විය. සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම්වලින් සියයට 26 ක් මුදල් හා මුදල් සමාන දෑ වලින් නියෝජනය වූ අතර ආයතනයේ සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුළ රඳවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර භෞතික ප්‍රගතිය මැන බැලීම සඳහා කාර්යසාධන වාර්තාද පිළියෙල කර නොතිබුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශය සඳහා පමණක් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය අධ්‍යයන වර්ෂ 04 තුළදී ලියාපදිංචි කිරීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව 4,910 ක් වූ අතර එයින් ශිෂ්‍යයන් 4,489 ක් පමණක් ලියාපදිංචි වී තිබුණි. ඒ අනුව ශිෂ්‍යයන් 421 ක් හෙවත් ලියාපදිංචි කිරීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 8.57 ක් ලියාපදිංචි වී නොතිබුණි.

(ආ) 2009/10, 2010/11, 2011/12 අධ්‍යයන වර්ෂ 03 තුළ සිසුන් 2,888 ක් ලියාපදිංචි කර තිබූ අතර ඔවුන්ගෙන් සිසුන් 2,427 ක් උපාධිය සම්පූර්ණ කර තිබුණද, ලියාපදිංචි වූ සිසුන්ගෙන් සියයට 16 ක් උපාධිය සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) 2011/2012 අධ්‍යයන වර්ෂයේ සිට 2015/2016 අධ්‍යයන වර්ෂය දක්වා වූ අධ්‍යයන වර්ෂ 05 ක් තුළ විශ්වවිද්‍යාලයේ පීඨ 5 ට පළමු වසර සඳහා ශිෂ්‍යයින් 5,255 ක් ලියාපදිංචි කර තිබූ අතර ඔවුන්ගෙන් ශිෂ්‍යයන් 104 දෙනෙකු හෙවත් සියයට 02 ක් පළමු වසර තුළම උපාධි පාඨමාලා හැරගොස් තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා අවසන් වරට 2011 වර්ෂයේ ලියාපදිංචි කරන ලද සිසුන් 185 කට පළමු වසරේ විභාගය 2013 ජූලි මස ද, දෙවන වසරේ විභාගය 2015 මැයි මස ද, තෙවන වසර විභාගය 2017 ජූලි සහ අගෝස්තු මාස වලද පවත්වා තිබුණි. සිසුන් බඳවා ගෙන වසර 06 ක් ඉකුත් වී තිබුණ ද, අවුරුදු තුනක උපාධි පාඨමාලාව 2018 මැයි වනවිටත් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද අවසන් වසර විභාගය සඳහා පෙනීසිටින ලද සිසුන් සංඛ්‍යාව 101 ක් පමණක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍යයන් 3,945 දෙනෙකුගේ අධ්‍යයන පිරිවැය රු. 1,258,777,399 ක් වූ අතර, ඒක ශිෂ්‍ය පිරිවැය රු. 319,082 ක් විය. ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 3,758 දෙනෙකුගේ අධ්‍යයන පිරිවැය රු. 1,117,968,314 ක් වූ අතර ඒක ශිෂ්‍ය පිරිවැය රු. 297,490 ක් විය. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ඒක ශිෂ්‍ය පිරිවැය රු. 21,592 කින් වැඩි වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් ඇණවුම් කරන ලද වටිනාකම රු.15,964,000 ක් වූ Desk top වර්ගයේ පරිගණක 130 ක් නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවන ලෙස සැපයුම්කරු විසින් සපයා තිබූ අතර ඒ පිළිබඳ පරීක්ෂා කිරීමෙන් තොරව විශ්වවිද්‍යාලය විසින් එම පරිගණක භාරගෙන තිබුණි. ඒ අනුව නියමිත පිරිවිතරවලට උපකරණ සපයා නොතිබීම මත සැපයුම්කරු ගිවිසුමේ කොන්දේසියක් කඩකර තිබුණද සිදු වූ පාඩුව අවම කර ගැනීම සඳහා රු.1,631,288 ක් වූ කාර්යසාධන සුරක්ෂණය මුදල් කරවා ගැනීමට සහ වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන ගිවිසුම්ගත වටිනාකමෙන් සියයට 5 ක වට්ටමකට යටත්ව ගෙවීම් කිරීමට එකඟ වී රු. 13,569,400 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයේ වාර්තාව පරිදි නීත්‍යානුකූලව කටයුතු සිදුකිරීමට තීරණය කර ඇති බව උපකුලපති විසින් විගණනය වෙත පිළිතුරු ලෙස දන්වා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ අපද්‍රව්‍ය දිරන හා නොදිරන අපද්‍රව්‍ය ලෙස වෙන් කිරීමකින් තොරව බැහැර කරන අතර එසේ දිනකට බැහැර කරන ටොන් 2 ක් පමණ වූ අපද්‍රව්‍ය 2015 වර්ෂයේ ජනවාරි සිට නන්පේරියල් නැමති රජයේ ඉඩමට මුදා හැර තිබුණි. එම අපද්‍රව්‍ය වනයේ බොහෝ ස්ථානවලට පැතිරී ගොස් තිබුණු බැවින් පරිසරය දූෂණය වීමට මෙන්ම වන සතුන්ට අහිතකර තත්ත්වයක් ඇතිවීමට ද හේතු විය හැකි බව නිරීක්ෂණය විය.

(ඇ) 2008 වර්ෂයට පෙර සිට ලැබියයුතු ලෙස ඉදිරියට ගෙන එන ලද රු. 189,303 ක් වූ කෘෂි විද්‍යාපීඨයේ මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබූ බව අනාවරණය වුවද ඒ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

විශ්වවිද්‍යාලයට අයත් අරමුදල් 04 කට අදාළව රු. 1,809,885 ක් වූ ශේෂය අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය නොකර වර්ෂ 03 සිට වර්ෂ 07 ක් දක්වා කාලපරාසයක් නිෂ්කාර්යව පැවතුණි.

**4.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යාපීඨයට අදාලව පිටත පුහුණු ඒකකය (Out Bound Training Centre) පිහිටුවීම සඳහා 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය මගින් 2016 වර්ෂයේදී රු. 2,725,000 ක් වූ භාණ්ඩ හා උපකරණ විශ්වවිද්‍යාලයට ලබා දී තිබුණද, ඒ වෙනුවෙන් යටිතල පහසුකම් සහ සැලසුම් සකස් කර නොතිබීම හේතුවෙන් 2018 මැයි වනවිටත් එම උපකරණ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

තවද එම ව්‍යාපෘතිය මගින් 2013, 2014, 2015 සහ 2016 වර්ෂවලදී විශ්වවිද්‍යාලය වෙත ලබා දී තිබූ රු. 1,262,584 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ, කාර්යාල උපකරණ සහ පුස්තකාල පොත් 2018 මැයි වනවිටත් ප්‍රයෝජනයට නොගෙන දැනට වසා දමා ඇති මෙහෙයුම් තාක්ෂණ සේවා මධ්‍යස්ථානය ( OTS ) තුළ ගබඩා කර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලයේ ඇති ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයේ කොටස් ගෙවීයාම හේතුවෙන් 2015 දෙසැම්බර් සිට එම යන්ත්‍රය අක්‍රීය වී තිබුණු අතර එය අළුත්වැඩියා කිරීමට කටයුතු නොකර මුද්‍රණාලයම වසා දැමීමට කටයුතු කර සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මුද්‍රණ කටයුතු පුද්ගලික අංශයෙන් රු. 5,509,287 ක් වැයකර ඉටුකරවාගෙන තිබුණි. මුද්‍රණ කටයුතු සඳහා පුහුණුවීම් ලබාදී තිබුණු මුද්‍රණාලයේ සේවකයින් තිදෙනෙකු වෙනත් ඒකකයන්ට අනුයුක්ත කර තිබූ අතර 2018 මැයි වනවිටත් එම මුද්‍රණාලය සහ එහි තිබූ රු. 449,955 ක් වූ පාරිභෝජන ද්‍රව්‍ය තොගය නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට අනුබද්ධිතව වැසිකිළි ඉදිකර දෙන ලෙස එහි කාර්ය මණ්ඩලය විසින් ඉල්ලීම් කර තිබුණද රු. 530,872 ක් වැයකර වැසිකිළිය ඉදිකර තිබුණේ වෛද්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට පිටතින් වීම නිසා එය භාවිතයකින් තොරව 2017 මැයි සිට නිෂ්කාර්යව පැවතුණි.

**4.5** **කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත ස්ථිර මහාචාර්ය තනතුරු හා කථිකාචාර්ය තනතුරු 287 කින් තනතුරු 76 ක් ද, අනුමත තාවකාලික කථිකාචාර්ය තනතුරු 51 කින් තනතුරු 30 ක් ද අනෙකුත් තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 83 කින් තනතුරු 35 ක් ද වශයෙන් තනතුරු 141 ක පුරප්පාඩු පැවතුණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මෙම පුරප්පාඩු හේතුවෙන් බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුල බාහිර කථිකාචාර්ය ගාස්තු ලෙස රු. 22,439,891 ක් ගෙවා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පරිපාලන තනතුරු 19 ක්, අධ්‍යයන සහාය කාර්යය මණ්ඩල තනතුරු 8 ක් සහ අනධ්‍යයන තනතුරු 144 ක් වශයෙන් පුරප්පාඩු 171ක් පැවතුණි. එම පුරප්පාඩු හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා වශයෙන් රු. 24,298,614 ක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 2016 වර්ෂයේ රු. 2,308,358 ක් වූ ඒක සේවක පිරිවැය, සමාලෝචිත වර්ෂයේ රු. 2,352,446 ක් වීමෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඒක සේවක පිරිවැය රු. 44,088 ක වැඩිවීමක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 2016 වර්ෂයේ රු. 785,632 ක් වූ ඒක සේවක පිරිවැය, සමාලෝචිත වර්ෂයේ රු. 902,604 ක් වීමෙන් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඒක සේවක පිරිවැය රු. 116,972 ක වැඩි වීමක් නිරීක්ෂණය විය.

**5.** **තිරසාර සංවර්ධනය**

**5.1** **තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගෙන නොතිබුණි.

**6.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2018 මැයි 17 දිනදීය. එසේ වුවද ඒ සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

## 6.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුර සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට පුරප්පාඩු වී තිබූ අතර විගණක සහායක තනතුරු 02 ක් සඳහා බඳවා ගැනීම්ද සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණනය සැලසුම් කර ඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා බාධාවක් වී තිබුණි.

## 6.3 විගණන කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් මාස තුනකට වරක් විගණන කමිටු පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුල කමිටු 02 ක් පමණක් පවත්වා තිබූ අතර 2017 ජුලි සිට 2018 ජුනි දක්වා කමිටුව පවත්වා නොතිබුණි.

## 6.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.4.1 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබීම නිසා පරිගණක, පරිගණක උපාංග සහ ඉගෙනුම් උපකරණ මිලදී ගැනීමේ හා ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයක් සඳහා පිළිවෙලින් මාස 10 සිට මාස 13 දක්වා කාලයක් හා මාස 5 ක කාලයක් ගතකර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1.(ඇ) වගන්තිය ප්‍රකාරව අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කර ඇති බවට ස්ථිර බැඳීමකින් තොරව ප්‍රසම්පාදන ක්‍රියාවක් ආරම්භ නොකළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවද භූ විද්‍යාපන පීඨය සඳහා රු. 42,550,000 ක් වටිනා මිණුම් උපකරණ මිලදී ගැනීමට අදාලව 2016 වර්ෂයේ දී මුදල් ප්‍රතිපාදන වෙන්කර නොතිබීම නිසා ඒ වෙනුවෙන් 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් රු. 16,200,000 ක් වූ ප්‍රසම්පාදන විෂයයන් 3 ක් අවලංගු කර ඉහත මිලදී ගැනීම සිදුකර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනය මාස 08 ක කාලයක් තුල නිම කිරීමේ පදනම මත රු. 2,960,000 ක වටිනාකමකට 2017 ජූලි පුද්ගලික ආයතනයක් වෙත පවරා රු.1,888,300 ක් ගෙවා තිබුණද, 2018 මැයි වනවිටත් එම කටයුතු නිමකර නොතිබුණි.

### 6.4.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා ගෘහභාණ්ඩ සහ පරිගණක උපාංග සැපයීමේ ප්‍රමාදය මත සැපයුම් ගිවිසුම් ප්‍රකාරව අයකල යුතු රු. 2,606,361 ක ප්‍රමාදයන් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කෘෂි විද්‍යා පීඨයේ ගොවිපළ සඳහා ප්‍රවේශ මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියට අදාලව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී පළාත් සභාවේ අනුමත රේටයන් යොදා නොගැනීම නිසා ඇස්තමේන්තුවේ විෂයයන් 02ක් සඳහා රු. 199,071 ක අධි ඇස්තමේන්තු කිරීම හා ඇස්තමේන්තුවේ එක් විෂයයක් සඳහා රු. 11,990 ක ඌණ ඇස්තමේන්තු කර තිබීම හේතුවෙන් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6.5 අයවැය පාලනය

------------------

ස්වයං මූල්‍ය පාඨමාලාවල ආදායම් සහ වියදම් සඳහා පිළියෙල කර තිබූ ඇස්තමේන්තු සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ අයවැය ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ එම පාඨමාලාවල ආදායම් හා වියදම් පිළිවෙලින් රු. මිලියන 52.09 ක් හා රු. මිලියන 39.15 ක් විය.

## 6.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

----------------------------------

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය ප්‍රකාරව 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6.7 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

2017 අගෝස්තු 09 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබෙන නියෝග ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පහත පරිදි විය.

(අ) 2011 වර්ෂයෙන් පසුව ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව නවීකරණය කර නව ශිෂ්‍ය කණ්ඩායම් බඳවා ගැනීමට 2018 මැයි වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේදී රු. 123,052,693 ක් වැයකර ඉදිකර තිබුණු විශ්වවිද්‍යාලයේ ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩාගාරයේ පැවති අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළයුතු බව නියෝග කර තිබුණද, 2018 මැයි වනවිටත් වටිනාකම රු. 5,156,160 ක් වූ රඳවා ගැනීමේ මුදල් භාවිතා කර ක්‍රීඩාපිටිය පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපති වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ආදායම් , වියදම් සහ වත්කම්, බැරකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කිරීම. |
| | (ii) ලෙජර් ගිණුම් ශේෂ හා ලේඛන නොසැසඳීම. |

| | | |
|---|---|---|
| (ආ) | වත්කම් පාලනය | වත්කම් ඌන උපයෝජිතව පැවතීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | (i) පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම.<br>(ii) විනිවිදභාවය ආරක්ෂා වන පරිදි බඳවාගැනීමේ පරිපාටි සකස්කර නොතිබීම |
| (ඈ) | මෙහෙයුම් පාලනය | ආරක්ෂක අංශයේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමට නිසි පාලන ක්‍රමවේදයක් හඳුන්වා නොතිබීම |
| (ඉ) | අභ්‍යන්තර විගණනය | අර්ධවාර්ෂික විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම |